**ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 247 - ශ්‍රී ලංකා රේගුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රේගුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගනනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) තැන්පතු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල සහ රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල යන තැන්පතු ගිණුම් දෙකට අදාලව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2022 ජනවාරි 01 දිනට දැක්වුණු ශේෂයන් ඒසීඒ 4 ප්‍රකාශනයේ ආරම්භක ශේෂයන් සමග සැසඳීමේදී පිළිවෙලින් රු. 2,122,369 ක සහ රු. 11,264,393 ක වෙනසක් වූ අතර හේතු හඳුනාගැනීමකින් තොරව එකී වෙනස රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. | නිරීක්ෂණය හා එකඟවෙමි. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි හා විනිවිදභාවයකින් යුතුව ගිණුම්කරණය සිදු කළ යුතු බව. |
| (ii) | 2011 වර්ෂයේ සිට 2016 දක්වා ගුවන් මගීන් රැගෙන එන භාණ්ඩ පිළිබඳ තැන්පතු ගිණුමේ ආරම්භක ශේෂය රු. 2,003,201 ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | 2011 සිට 2016 දක්වා ගුවන් මගීන් රැගෙන එන භාණ්ඩ පිළිබඳ තැන්පත් ගිණුමේ දෙපාර්තමේන්තු ලෙජරයේ වැරදි ලෙස සටහන් වූ රු.2,003,201.00ක ශේෂය ඉවත් කර ලෙජරය තුලනය කිරීම මගින් 2022 වර්ෂයේ ගිණුම් සකස් කර, අවසාන ශේෂය සඳහා කේවල ශේෂ ලැයිස්තුව ද පිළියෙල කර ඇත. | ඉදිරියේදී ශේෂයන්හි වෙනස හඳුනාගෙන නිවැරදිව ගිණුම්කරණය සිදු කළ යුතු බව. |

**(ආ) දේපල පිරියත උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුළදී ඇස්තමේන්තුගත තක්සේරු වටිනාකම රු. 4,420,000 ක් වූ වාහන 06ක් රු. 11,920,200 ක වටිනාකමකට විකුණා තිබුණු නමුත් එකී වත්කම්වල වටිනාකම ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි. | නිරීක්ෂණය සමග එකඟ වෙමි. | විකුණන ලද වත්කම්වල අගය ගිණුම්වලින් ඉවත් කළයුතු බව. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් වටිනාකම රු. 4,171,150,000 ක් ලෙස දැක්වුවද, පොදු 287 ආකෘතියේ පවත්වාගෙන යනු ලබන වත්කම් ලේඛනයේ අදාල වටිනාකම් නොදැක්වුනු බැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ඉඩම් වටිනාකම සැසඳීමට නොහැකි විය. | **2018** වර්ෂයේදී සැපයුම් හා සේවා අංශය වෙතින් ලබා දෙන ලද තක්සේරු වටිනාකම් මත පදනම්ව ඉඩම් වටිනාකම රු.**4,171,150,000** ලෙස මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇත. | මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් වටිනාකම වත්කම් ලේඛනයේ අදාල වටිනාකම් සමග සැසඳිය යුතු බව. |

## (ඇ) අග්‍රිම ශේෂය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ගිණුමේ මාර්ගස්ථව පැවති මුදල් ශේෂය රු.196,139,682 ක් වූ අතර දෙපාර්තමේන්තුවේ ගිණුම් අනුව මාර්ගස්ථ මුදල් ශේෂය රු.4,648,584,888 ක් වීම නිසා පොත් අනුව රු.4,452,445,206 ක වෙනසක් පැවතුණි. | දෙපාර්තමේන්තු ගිණුම් අනුව මාර්ගස්ථ මුදල් ශේෂය ලෙස රු.4,648,584,888 මගින් නියෝජනය වන්නේ 2022 මුදල් වර්ෂය තුලදී මහජන බැංකු ගිණුමෙන් ලංකා බැංකුව වෙත මාරු කරන ලද මුදල් ශේෂය හා වර්ෂය තුල අග්‍රිම ලෙස භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත මාරු කරන ලද මුදල් වටිනාකම වේ. | භාණ්ඩාගාර පොත් සමග දෙපාර්තමේන්තුවේ පොත් සැසඳිය යුතු බව. |

## (ඈ) විගණන සාක්ෂි නොවීම

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් 2277 දෙනෙකු සඳහා වැටුප්, වේතන, අතිකාල, නිවාඩු දින වැටුප් හා දිරිදීමනා වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් රු.2,143,225,499 ක් ද රේගු අතිකාල නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු හා තොරතුරු තාක්ෂණ සන්නිවේදන අරමුදල මගින් රු.1,064,935,195 ක්ද වශයෙන් එකතුව රු.3,208,160,694 ක් ගෙවා තිබූ අතර එකී වියදම සම්බන්ධයෙන් තහවුරු කිරීමේ සාක්ෂිය වන සේවයට වාර්තා කළ බව සනාථ කෙරෙන ඇඟිලි සළකුණු වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි. රේගුවේ අංශ 04ක පැමිණීමේ සහ පිටවීමේ ලේඛන, අතිකාල ලේඛන සහ නිවාඩු ලේඛන පරීක්ෂාවේදී සති අන්තයන් සහ රජයේ | රේගු දෙපාර්තමේන්තුවේ පැමිණීම සටහන් කිරීමට භාවිතා කරනු ලබන්නේ පැමිණීමේ ලේඛනය වේ. රේගු කාර්ය මණ්ඩලය පැය 08 ක සේවා මුරයකට සීමා නොවී රාජකාරී නිරත වන බැවින් ඇඟිළි සලකුණු යන්ත්‍ර භාවිතය සම්බන්ධව ප්‍රායෝගික ගැටලු සම්බන්ධයෙන් උපදෙස් මේ වනවිටත් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත. | සේවයට වාර්තා කිරීම් සටහන් කිරීම් සම්බන්ධයෙන් නිවැරදි අභ්‍යන්තර පාලන ක්‍රමවේද අනුගමනය කළ යුතු බව. |

නිවාඩු දිනයන්ද ඇතුළුව නිවාඩු නොගෙන සෑම දිනකම සේවකයන් සේවයට වාර්තා කර තිබුණි. මෙම සේවකයන් දිනකට පැය 24ක් දක්වා අතිකාල දීමනා ද ලබා ගන්නා අතර පැමිණීම් සහ පිටවීම් පිළිබඳව නිසි සනාථ කිරීමකින් තොරව ඉහත ගෙවීම් සිදු කරන බව නිරීක්ෂණය කෙරේ.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

රේගු අධ්‍යක්ෂ ජනරාල් ආදායම් සංකේත 13 කට අදාලව ආදායම් ගණන්දීමේ නිලධාරියෙකු වශයෙන් කටයුතු කර තිබුණි. එම ආදායම් සංකේත සම්බන්ධව පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **මූලික ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තු ගත ආදායම** | | |
| **(i)** | ආදායම් සංකේත 12 කට අදාලව මූලික ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තුව අතර සියයට 8 සිට සියයට 81 දක්වා වූ පරාසයක ඌණ විචලනයක් විය. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. | ඇස්තමේන්තු විචක්ෂණශීලීව සකස් කළ යුතු බව. |
| **(ii)** | ඒසීඒ - 1 (ii) ලේඛනය ප්‍රකාරව මූලික ආදායම් ඇස්තමේන්තුව හා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර වෙනස ප්‍රතිශතයක් ලෙස දැක්වීමේදී එකී වෙනස මූලික ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස ගණනය කළ යුතු වුවද, ආදායම් සංකේත 12 ක ඒ වෙනුවට සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව මූලික ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස ගණනය කර දක්වා තිබූ අතර මේ හේතුව නිසා ආයතනය විසින් වෙනසට හේතු වශයෙන් ඉදිරිපත් කරන ලද තොරතුරු පිළිගත නොහැකි විය. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. | ප්‍රතිශත සැකසීමේදී නිවැරදිව උපදෙස් පිළිපැදීමට පියවර ගතයුතු බව. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | **සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම හා තත්‍ය ආදායම** | | |
| | ආදායම් ශීර්ෂයන් 3ක සමාලෝචිත වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම හා තත්‍ය ආදායම අතර සියයට 05 සිට සියයට 19 ක් දක්වා වූ පරාසයක ඍණ විචලනයක් සිදු වී තිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. | ඇස්තමේන්තු විචක්ෂණශීලීව සකස් කළ යුතු බව. |
| **(ඇ)** | **පූර්ව වර්ෂයේ ආදායම සමඟ සැසඳීම** | | |
| | සමාලෝචිත වර්ෂයේ ආදායම් හා පූර්ව වර්ෂයේ ආදායම් සමඟ සැසඳීමේදී ආදායම් සංකේතාංක 07 කට අදාලව ආදායමෙහි සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණු අතර එය සියයට 4 සිට සියයට 28 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. | ආදායම් වර්ධනය කළ හැකි ක්‍රමවේද පිළිබඳව අවධානය යොමුකළ යුතු බව. |
| **(ඈ)** | **හිඟ බදු ආදායම්** | | |
| (i) | 2022 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු ආදායමෙන් රු. 23,230,293,071 ක් හෙවත් සියයට 38 ක් නියෝජනය කරනු ලබන්නේ ආනයන හිඟ බදු වේ. ඉන් රු. 22,714,244,813 ක් 2019 වර්ෂයට ද පෙර සිට පැවත එන හිඟ ආදායම් ය. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. | රජයට ලැබිය යුතු ආදායම් ප්‍රමාදයකින් තොරව රැස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |
| (ii) | 2022 දෙසැම්බර් 31 දිනට සමස්ත හිඟ බදු ආදායමෙන් රු. 16,076,072,367 ක් හෙවත් සියයට 26 ක් නියෝජනය කරනු ලබන්නේ විශේෂ වෙළඳ භාන්ඩ බදු වලිනි. ඉන් රු. 16,064,240,567 ක් 2019 වර්ෂය හා ඊට පෙර වර්ෂවල සිට පැවත එන හිඟහිටි ආදායම්ය. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. | -එම- |
| (iii) | 2022 දෙසැම්බර් 31 දිනට සමස්ත හිඟ බදු ආදායමෙන් රු. 10,476,732,912 ක් එනම් සියයට 17 ක් වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු වූ අතර ඉන් ද රු.10,247,074,664 ක් එනම් සියයට 98 ක් 2019 වර්ෂය හා ඊට පෙර වර්ෂවල සිට පැවත එන හිඟ ආදායම් ය. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. | -එම- |

| | | | |
|---|---|---|---|
| (iv) | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ බදු ආදායමෙන් රු. 6,137,991,353 ක් හෙවත් සියයට 10 ක් නිරූපණය කරන්නේ ආනයන සෙස් බදු මුදලින් වන අතර එයින් රු.6,135,212,781 ක් 2019 වර්ෂය දක්වා පැවති හිඟ ආදායම්ය. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. | -එම- |
| (v) | 2022 ජනවාරි 01 දිනට පැවති රු. 61,999,994,128 ක් වූ සමස්ථ හිඟ බදු ආදායමෙන් සමාලෝචිත වර්ෂය තුල රු. 5,767,519,628 ක් අය කරගෙන තිබුණු අතර එම ප්‍රමාණය සමස්ථ හිඟ බදු ආදායමෙන් සියයට 09 ක් වැනි අවම මට්ටමක පැවතුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. | -එම- |
| (vi) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පවතින රු. 61,254,145,583 ක් වූ සමස්ථ හිඟ බදු ආදායමෙන් රු.39,063,403,231 ක් එනම් සියයට 63 ක් මුදල් අමාත්‍යාංශයෙන් අය විය යුතු හිඟ ආදායම් වටිනාකමක් ඇතුලත් විය. | නිරීක්ෂණය හා එකඟ වෙමි. | -එම- |

## 2.2 වියදම් කළමනාකරණය

### 2.2.1 පුනරාවර්ථන වියදම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු**<br>සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂයයන් 08 ක මූලික ඇස්තමේන්තු හා සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර සියයට 20 ක සිට සියයට 136 ක් වූ පරාසයක විචලතාවයන් විය. ඒ අනුව මූලික ඇස්තමේන්තු සකස් කිරීමේ දී පසුගිය වර්ෂයන් හි වියදම් පිළිබඳ සමාලෝචනයක් සිදු කර හැකිතාක් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පුරෝකථනය කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සමග එකඟ වෙමි. | ඇස්තමේන්තු විචක්ෂණශීලීව සකස් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | **ප්‍රතිපාදන ඉතිරිවීම**<br>සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන වියදම් සම්බන්ධයෙන් වැය විෂයයන් 21 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 6 සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවීමක් නිරීක්ෂණය විය. | නිරීක්ෂණ සමග එකඟ වෙමි. | ඇස්තමේන්තු විචක්ෂණශීලීව සකස් කළ යුතු බව. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | | | |
|---|---|---|---|
| **(අ)** | ලංකා විදුලිබල මණ්ඩලයට අදාලව රු.9,673,881 ක වගකීමක් වුවද එය 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැදීම් හා බැරකම් ලේඛනය තුළ දක්වා නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. | බැදීම් හා බැරකම් ලේඛනය තුළ සියලු වගකීම් දැක්විය යුතු බව. |
| **(ආ)** | 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල හෝ බැරකම් ලේඛනයේ ඇතුළත් නොවූ නමුත් වැය විෂයයන් 12කට අදාළව ගෙවූ 2023 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසයන්හි මුළු බැරකම් එකතු වටිනාකම රු. 22,399,020 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. | -එම- |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | **නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | 1968 අංක 17 දරන රේගු ආඥා පනත | | | |
| (i) | 153 (2) (ආ) වගන්තිය | ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කල යුතු වුවද,1988 ජනවාරි 28 දින අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ | රේගු දෙපාර්තමේන්තු ත්‍යාග මුදල් බෙදා හැරීම සම්බන්ධව දැනට දෙපාර්තමේන්තුව විසින් 1988 ජනවාරි මස 28 දින අංක 118 ප්‍රතිපත්ති ලේඛනය අනුව හා ඊට අදාළ සංශෝධිත දෙපාර්තමේන්තු නියෝග අනුව කටයුතු සිදු කරනු ලබන අතර, ඒ | රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 1999 වසරේ සිට 2022 වර්ෂය දක්වා වූ වර්ෂ 23 ක් තුළ ත්‍යාග අරමුදල් ලෙස නිලධාරීන් සඳහා රු.20,870,564,416 ක්ද, ඔත්තුකරුවන් සඳහා රු.3,143,829,243 ක් ද බෙදා හැර තිබුණි. | සඳහා මුදල් අමාත්‍යතුමාගේ එකගතාවය ලබා ගැනීම සම්බන්ධව සොයා බැලීම සඳහා තවදුරටත් දෙපාර්තමේන්තුව විසින් පෙර වර්ෂ වල නිකුත් කර ඇති දෙපාර්තමේන්තු නියෝග සහ අදාළ ලිපි ලේඛන පරීක්ෂා කර බලා වාර්තා කිරීමට සටහන් කර ගතිමි. | |
| (ii) | 84 (අ) (3) වගන්තිය | බන්දිත ගුදම් (Manufacture in Bond – MIB) පහසුකම ලබාගත් යම්කිසි කර්මාන්තයකට අදාලව භාණ්ඩ දේශීය වෙළඳපොලට නිකුත් කිරීමේ දී ආනයන සේ සලකා තීරු බදු ගණන් බැලිය යුතු වුව ද, එවැනි සමාගම් 02 ක් අංක 1448/1 හා 2006 ජුනි 05 දිනැති කර්මාන්ත විෂයභාර අමාත්‍යවයා විසින් නිකුත් කරන ලද “දේශීයව සියයට 30 ට නොඅඩු අගයක් සහිත උපාංග යොදා ගනිමින් එකලස් කරන වාහන සඳහා ලබා දෙන සියයට 70 ක බදු සහනය” ලබා ගනිමින් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු. 7,191,949,084 ක නිෂ්පාදන බදු ගෙවීම පැහැර හැර තිබුණි. | රේගු ආඥා පනතේ 84 (අ) (3) වගන්තිය යටතේ නිෂ්පාදන බදු ගෙවීමේදී ආනයනයක් සේ සැලකිය යුතු බැවින් එවිට නිෂ්පාදන බදු පනතේ 5 (1) ආ සහ 5 (2) (අ), 5 (2) (ආ) වගන්තිවල පවතින ප්‍රතිපාදන අදාල කරගත යුතුය. | රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) | XIV පරිච්ඡේදයේ 4.1 හා 4.4 උප වගන්ති | 2022 වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා සිදුකළ වවුචර් පරීක්ෂාවේදී යොමුගත වගන්තියට පටහැනිව ගමනේ දුර සැතපුම් හතකට වැඩි යන්න හෝ ගත වූ කාලය පිළිබඳව සැලකිල්ලක් නොදක්වා අවස්ථා 207 කදී රු.5,378,494 ක මුදලක් සැතපුම් කුලී ලෙස ගමන් වියදම් සඳහා ගෙවීම් සිදුකර තිබුණි. | ප්‍රධාන වශයෙන්ම ඔරුගොඩවත්ත ආහාර ගබඩා පරිශ්‍රය තුල පවත්වාගෙන යන රේගු උප කාර්යාලයන්හි සේවය කරන නිලධාරීන් සම්බන්ධයෙන් බව නිරීක්ෂණය කරමි. | ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | XXIV පරිච්ඡේදයේ 4 වන උප වගන්තිය | •සමාලෝචිත වර්ෂය අවසාන දිනට මිය ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 05 ක් ඉක්මවූ ණය ශේෂය රු.59,426 ක් ද, වර්ෂ 01 සිට 02 දක්වා පැරණි අයකර නොගත් ණය ශේෂය රු.428,842 ක් ද, වසරකට වඩා අඩු ණය ශේෂය රු. 816,906 ක් ද විය.<br>• සමාලෝචිත වර්ෂය අවසාන දිනට විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු වර්ෂ 05 ක් ඉක්මවූ ණය ශේෂය රු.513,577 ක් ද, වර්ෂ 03 සිට 04 දක්වා ණය ශේෂය රු.211,273 ක් ද, වර්ෂ 01 සිට 02 දක්වා ණය ශේෂය රු.444,399 ක් ද, වසරකට වඩා අඩු ණය ශේෂය රු. 3,386,791 ක් ද විය.<br>• වැඩ තහනම්කර ඇති නිලධාරීන්ගෙන් වසරකට වඩා අඩු ණය ශේෂය රු. 591,959 ක් ද, වර්ෂ 01 සිට 02 දක්වා පැරණි ණය ශේෂය රු.321,884 ක් ද, වර්ෂ 04 සිට 05 දක්වා පැරණි ණය ශේෂය රු.68,800 ක් ද, වර්ෂ 05 ක් ඉක්මවූ ණය ශේෂය රු.1,370,235 ක් ද වූ අතර, සේවය හැර ගිය නිලධාරීන්ගෙන් වර්ෂ 01 සිට 02 දක්වා පැරණි ණය ශේෂය රු.309,534 ක් ද, වර්ෂ 05 ක් ඉක්මවූ ණය ශේෂය රු.473,073 ක් ද විය. අදාල නිලධාරීන්ගෙන් මෙම ණය ශේෂ අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | මිය ගිය නිලධාරි කාණ්ඩයේ ඇතුලත් වසර 05 ට වැඩි එක් නිලධාරියෙකුගේ ණය ශේෂය රු. 59,426.00 කි. විශ්‍රාම ගිය නිලධාරින් වසර දහයකට පෙර විශ්‍රාම ගිය අය වේ. මෙම නිලධාරින් සම්බන්ධව ගොනු සොයාගත නොහැකි වී ඇති අතර තවදුරටත් පරික්ෂා කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ. 102 සිට 110 | විදේශිය පුද්ගලික ආයතනයක් විසින් නැවකින් නැවකට භාණ්ඩ මාරු කිරීමේ ක්‍රමය යටතේ (Transshipment) සිංගප්පූරුවෙන් නැව්ගත කරනු ලැබූ දුම්වැටි තොගයක් ශ්‍රී ලංකා රේගුව විසින් අත්අඩංගුවට ගෙන විමර්ශනයක් සිදු කර තිබුණු අතර එහි තීන්දුව අනුව අදාල සිගරට් තොගය ප්‍රතිනැව්ගත කිරීමට අවසර ලබා දී තිබුණි. එසේ තිබියදී රේගුව විසින් මතභේදාත්මක ලෙස එම දුම්වැටි තොගය වෙන්දේසිකර විකුණා රු. 5,901,750 ක මුදලක් උපයාගෙන තිබුණි. කෙසේවුවද, එම විකිණීමට එරෙහිව අදාල විදේශ ආයතනය නඩු පවරා තිබුණු අතර දිසා අධිකරණයෙන් රේගුව වැරදිකරු වී තිබුණි. එකී තීන්දුවට එරෙහිව රේගුව සිවිල් අභියාචනාධිකරණයේ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා තිබුණු නමුත් ඉන් ආනයනකරුට සිදුවූ අලාභය වෙනුවෙන් රු.37,529,749 ක්ද, නෛතික පොළිය ලෙස රු.63,464,121 ක්ද, නඩු ගාස්තුව ලෙස රු.190,000 ක්ද ගෙවීමට නියමව තිබුණි. නෛතික ගාස්තු රු.31,732,060 ක් දක්වා අඩු කිරීමට ආනයනකරු හෙවත් පැමිණිලිකාර පාර්ශවය එකගව තිබූ අතර ඒ අනුව රේගුවට මෙම වැරදි තීරණය මත ගෙවීමට සිදුවූ මුලු අලාභය රු.69,451,809ක් විය. මෙම විමර්ශනයට අදාළ ගොනුව අස්ථානගත වී ඇති බව විගණනයට 2022 සැප්තැම්බර් 22 | ශ්‍රී ලංකා රේගුව විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව හා මුදල් අමාත්‍යාංශයේ අවසර සහිතව උසාවියෙන් නියම කළ ගෙවීම සිදු කර ඇත. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | දින රේගුව විසින් වාර්තා කර තිබුණු අතර එයට වගකිවයුතු නිලධාරින්ට සහ ඉහත වැරදි තීරණයට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | | |
| (ii) | 2022 අප්‍රේල් 04 දිනැති අංක 05/2022 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | රජයේ දේපල අස්ථානගත වීම සහ අවභාවිතා වීම වැළැක්වීමට සහ රජයේ දේපල උපරිම ඵලදායිතාවයෙන් ප්‍රයෝජනයට ගැනීම තහවුරු කිරීම සඳහා සියලුම වත්කම් ලේඛනගත කල යුතු වුවද, ගිණුම් අංශයේ පවත්වාගෙන යනු ලබන සිගැස් වැඩසටහනට අදාල වත්කම් ලේඛනය අනුව වාහන 102 ක් පැවති අතර, සැපයුම් හා සේවා අංශය විසින් නඩත්තු කරන ලද වාහන වියදම් වාර්තාව අනුව වාහන 109 ක් විය. කෙසේවුවද, එම අංශය විසින්ම වාහන වලට අදාලව නඩත්තු කරන ලද ස්ථාවර වත්කම් ලේඛන 03ට අනුව ආයතනය සතු වාහන 165 ක් විය. | ශ්‍රී ලංකා රේගුව සතුව වාහන 109 ක් පවතී. ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර ඇතත් භෞතිකව නොමැති , අපහරණය කිරීම සම්බන්ධයෙන් සාක්ෂි නොමැති වාහන 56 ක් සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීම සම්බන්ධව රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විමසන ලදුව එම ගොනුව 2022.10.18 දින නීති අංශය වෙත යොමු කර තිබිණි. | චක්‍රලේඛ විධිවිධානයන්ට අනුගත විය යුතු බව. |

## 2.6 අධිභාර කිරීම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රේගු දෙපාර්තමේන්තුව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුම්ගතව ඔරුගොඩවත්ත අංක 12 ගබඩාව පිහිටි ස්ථානය කුලී පදනම මත ලබාගෙන තිබුණු අතර එහි මාසික ගෙවීම් ප්‍රමාදවීම මත පැනවූ අධිභාරය රු. 3,655,985 ක් විය. | මෙම අධිභාරය මු.රෙ. 113 වගන්තිය යටතේ අත්හැර දැමීමට හා පොත්වලින් කපා හැරීමට කටයුතු කරන ලෙස දන්වා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට 2022.01.25 දින දන්වා යවා ඇත. | මාසික ගෙවීම් ප්‍රමාදවීම්වලින් තොරව සිදු කළයුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රේගු ප්‍රධාන කාර්යාලය හා ශාඛා කාර්යාලවලට 2022 වර්ෂය වෙනුවෙන් ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව සුදුසු ආයතන වලින් ලංසු කැඳවීමකින් තොරව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PFD/RED/01/05/2015/3 සහ 2015 මැයි 22 දිනැති ලිපිය ප්‍රකාරව වසර 05 ට වැඩි කාලයක සිට පෙර වර්ෂයන්හි ආරක්ෂක සේවාව සැපයූ ආයතනයෙන්ම සමාලෝචිත වර්ෂයේද සේවය ලබා ගැනීමට එකඟවී තිබුණි. ඒ අනුව එම ආරක්ෂක සමාගමට සමාලෝචිත වර්ෂයේදී ද රු.27,821,760 ක මුදලක් ආරක්ෂක සේවා සැපයීම සඳහා ගෙවා තිබුණි. | ආරක්ෂක සේවාව සපයා ඇත්තේ රක්නා ආරක්ෂක ලංකා සමාගම විසින් වන අතර එම සේවාව සපයා ඇත්තේ එකම මිල ගණන් යටතේ ය. | සේවා ලබාගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කළ යුතු බව. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව නව සැපයුම්කරුවන් තෝරා නොගෙන 2015 සිට ගොඩනැගිලි කුලියට සැපයූ පාර්ශවයන්ගෙන්ම ගිවිසුම් අලුත් කරමින් මීගමුව, ඔරුගොඩවත්ත, මට්ටක්කුලිය, යාපනය සහ මත්තල යන ප්‍රදේශවලින් නිලධාරීන් සඳහා ගොඩනැගිලි කුලියට ගෙන සමාලෝචිත වර්ෂ සඳහා ද එකතුව රු.15,206,322 ක් ගෙවා තිබුණි. | 2015 වර්ෂයේ සිට ගොඩනැගිලි කුලියට සැපයූ පාර්ශවයන්ගෙන්ම ගිවිසුම් අළුත් කරමින් වාහන අංගන, ගබඩා සහ නේවාසික ගොඩනැගිලි ලබා ගෙන ඇත. | නව සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කළ යුතු බව. |

## 3.2 පාඩු හා හානි

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නො.40 මෝගන් පාර, කොම්පඤ්ඤවීදිය, කොළඹ 02 යන රේගුවට අයත් භූමියක අනවසරයෙන් ඉදිකර තිබූ නිවාස 15 ක් සම්බන්ධව නීතිමය කටයුතු කර නොතිබුණි. | අනවසර පදිංචි කරුවන් සම්බන්ධව තිරණය ගැනීම වසර ගණනක් තිස්සේ ලිපි මගින් විවිධ අවස්ථා වල බස්නාහිර පළාත් නියෝජ්‍ය පොලිස්පති වෙතත්, කොළඹ ප්‍රාදේශීය ලේකම් වෙතත් දැනුවත් කර ඇත. | අනවසර ඉදිකිරීම් සම්බන්ධව නීතිමය කටයුතු කළ යුතු බව. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දිනෙ දක්වා දෙපාර්තමේන්තුවේ අංශ (Directorate) 40 ට අදාලව රේගු විමර්ශන 9754 ක් පැවතුණු අතර, ඉන් ආදායම් අධීක්ෂණ ඒකකයට (RTF) අදාළව විමර්ශන 3199 ක් ද, නිවාරණ අංශයට (Preventive) අදාළව විමර්ශන 1593 ක් ද, මධ්‍යම විමර්ශන අංශයට අදාළව විමර්ශන 738 ක් ද, අනෙකුත් අංශ 37ට අදාලව විමර්ශන 4224ක් ද විය. සමාලෝචිත වර්ෂය අවසාන දිනට සමස්ත විමර්ශන සංඛ්‍යාවෙන් වසර 05 ට වඩා පැරණි 3582 ක්ද, වසර 1 ත් 5 ත් අතර 4720 ක්ද, වසරක් ඇතුළත වූ විමර්ශන 1452 ක් ද විය. | මෙතෙක් අවසන් කර නොමැති රේගු විමර්ශන කඩිනමින් අවසන් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇත. | විමර්ශන කඩිනම්ව අවසන් කිරීමට කටයුතු කළයුතු බව. |
| (ආ) | ටැන්සැනියාවේ Zanzibar වරායේ සිට ශ්‍රී ලංකා වරාය හරහා Hong Kong වෙත ප්‍රති අපනයනය කිරීම සඳහා අප්‍රිකානු සණ දැව (African Hard Wood) ලෙස සඳහන් කරමින් වඳවීමට ලක්ව ඇති හා ජාත්‍යන්තර වෙළඳාම සීමා කර ඇති මැලගසි රෝස (Rose Wood) මෙට්‍රික් ටොන් 420ක් බර දැව කඳන් 3669ක තොගයක් රේගුව විසින් රාජසන්තක කර විකිණීමට කිහිප අවස්ථාවකදී සැලසුම්කර තිබුණු නමුත් වනජීවී සංරක්ෂණ | මෙම **Rose Wood** දැව තොගය 2015.08.22 දින සිට මේ දක්වා හැටපස් වතාවක් (65) පමණ ටෙන්ඩර සඳහා ඉදිරිපත් කර ඇතත් ඉන් අවස්ථා 04 කදී පමණක් වැඩීම ඉල්ලුම්කරුවන් වෙත එම දැව තොගය ප්‍රදානය වී ඇතත් ඔවුන් අදාල මුදල් ගෙවා රේගුවෙන් එම භාණ්ඩ මුදා ගැනීමට කටයුතු කොට නොමැත. | අලෙවි කිරීමට යෝජිත රාජසන්තක කළ ද්‍රව්‍ය නොපමාව අලෙවි කර රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළයු බව. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව මගින් නිකුත්කල යුතු CITES බලපත්‍රය ලබා ගැනිමට නොහැකි වීම මත 2014 සිට 2023 අප්‍රේල් 30 දින වන විටත් ඉවත් නොකර රේගු අංගනයක ගබඩා කර තිබුණි. පදම් නොකළ කඳන් වීම මත මෙම දැව තොගයට මේ වන විටත් කෘමීන්ගෙන් හානි සිදු වී තිබුණු අතර 2014 සිට 2022 ජනවාරි දක්වා දැව තොගය ගබඩාකර තබා ගැනිම වෙනුවෙන් ග්‍රේ ලයින් කන්ටේනර් අංගනය මඟින් රේගුව වෙත රු.81,621,820 ක ඇස්තමේන්තු වියදමක් පිළිබඳව දැනුම්දී තිබුණි. | | |
| (ඈ) | බ්‍රසීලයේ සිට ආනයනය කරන ලද සීනි බහාලුම් තුළ කොකේන් මත් ද්‍රව්‍ය ඇති බවට ආනයනකරුගේම දැනුම් දීම මත රඳවා පරීක්ෂා කර පසුව මත් ද්‍රව්‍ය අඩංගු නොවන බවට තහවුරු කරගැනීමෙන් පසු ආනයනකරුට ආදාල සිනි බහාළුම් වලින් 04ක් නියමිත දිනට පෙර මුදා ගැනීමට අපොහොසත් වීම නිසා එම බහාලුම් සම්බන්ධයෙන් 2017 පෙබරවාරි මස විමර්ශනයක් ආරම්භ කර තිබුණි. ඒ අනුව රේගු ආඥා පනතේ 109 වගන්තිය යටතේ අදාල සීනි තොගය රාජසන්තක කර 2022 අප්‍රේල් මාසයේදී සත්ත්ව ආහාර ලෙස නැවත විකුණා තිබුණු අතර ඒ සඳහා වසර 05ක් ගතවී තිබුණි. | අදාල සීනි තොගය 2022.04.07 වන දින ටෙන්ඩර් කර ඇත. | විමර්ශන කඩිනම්ව අවසන් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) | විවිධ අංශ විසින් සිදුකරන රේගු විමර්ශන වලදී රේගු භාරයට ගන්නා ලද, වෙනත් නියාමන ආයතන විසින් රේගුවට බාර දෙන ලද සහ රාජසන්තක කරන ලද වාහන සහ බහාලුම් වෙන්දේසි හෝ අපහරණය කරන තෙක් රේගු අධීක්ෂණයේ රඳවා ගැනීම සඳහා වර්ග අඩි 18,000 ක භූමි භාගයක් පෞද්ගලික ආයතනයකින් කුලියට ගැනීම සඳහා | ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කරනු ලබන වාහන සහ බහාළුම් පරීක්ෂණ අවසන්වන තෙක් ආරක්ෂාකාරීව රඳවා තබා ගැනීමට 2015 සිට මට්ටක්කුලියේ පිහිටි පුද්ගලික ආයතනයකට අයිති අංගනයක් කුලී පදනම මත භාවිතයට ගනු ලබන අතර, ඒ සඳහා වන මාසික කුලී මුදල ශ්‍රී ලංකා රේගුව විසින් ගෙවනු ලබයි. | රඳවාගෙන ඇති බහාළුම් සහ අස්ථානගතවූ විමර්ශන ගොනු සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග නොපමාව ගතයුතු බව. |

2015 වර්ෂයේදී රේගුව ගිවිසුම්ගතව තිබුණු අතර එකී අංගනයේ 2023 ජනවාරි 31 දිනට රථවාහන 435ක් ද, බහාලුම් 91ක් ද ගාල්කර තිබුණි. ඉන් වාහන 261ක් සහ බහාලුම් 86ක් වසර 05කට වඩා අධික කාලයක සිට එම භූමියේ රඳවා තිබුණු අතර, වාහන 133 ට අදාල විමර්ශන ගොනු අස්ථානගතව තිබුණි. 2015 වර්ෂයේ සිට 2020 කාලපරිච්ඡේදය දක්වා පමණක් රේගුව අදාල පෞද්ගලික සමාගම සමඟ විධිමත් ගිවිසුමකට එළඹ තිබුණු අතර ඉන්පසුව 2023 ජනවාරි දක්වා අවස්ථා 05ක දී කාලය දීර්ඝ කරමින් භූමිය ප්‍රයෝජනයට ගෙන තිබුණි. 2015 වර්ෂයේ සිට 2023 ජනවාරි දක්වා අදාළ පෞද්ගලික ආයතනයට ගෙවූ සහ ගෙවිය යුතු මුලු කුලී මුදල් එකතුව රු. 77,485,548 ක් විය. වසර 05කට වඩා අධික කාලයක සිට ගාල්කර තිබුණු මෙම වත්කම් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග නොපමාව ගතයුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) **මිනිස් පරිභෝජනයට නුසුදුසු මාළු කන්ටේනර් 102 ක් රේගුවෙන් නිදහස් කිරීම**

සී ෂෙල්ස් සිට තායිලන්තය දක්වා ටුනා මත්ස්‍යයින් ගබඩා කළ බහාළුම් රැගත් CMA CGM Kailas නැමති නෞකාව කොළඹ වරායට ආසන්න මුහුදු ප්‍රදේශයේදී කාර්මික දෝෂයකට ලක්වීම හේතුවෙන් දින 20 ක් තිස්සේ විදුලි සැපයුම නතර වී ඇති බව සඳහන් කර ආසන්නම වරාය වූ ශ්‍රී ලංකාවේ වරාය අධිකාරිය වෙත දැනුම්දී තිබුණි. ඒ අනුව කඩිනම් පියවරක් ලෙස විදුලි ජනන යන්ත්‍ර භාවිතා කර විදුලිය ලබා දී ලංකාවේ තග් යාත්‍රා උපයෝගී කරගෙන 2022 ජනවාරි 13 දින අදාළ නැව මෙරට තුළම නවතා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර

මෙම සිද්ධිය **2022** වර්ෂයේ ආරම්භයේදී සිදුවූවකි.

| | | | |
|---|---|---|---|
| | තිබුණි. අදාල නැවෙහි තිබූ මාළු බහාළුම් 102 ක් මේ අවස්ථාව වන විට නරක් වී ඇති බවත් එම තොග නැවත අපනයනකරු භාර නොගන්නා බවත් පවසා නැව් නියෝජිත ආයතනය විසින් මාළු තොගය පිටස්තර පාර්ශවයකට සත්ව ආහාර හා කාබනික පොහොර සැකසීමට රේගුව මඟින් නිදහස් කිරීම සම්බන්ධයෙන් විගණනයේ දී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| **(i)** | මෙම මාළු තොගය අඩංගු නෞකාවෙහි ස්වභාවය Transshipment Status වුවද Import cargo status ලෙස වෙනස් කිරීමට ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂවරයා පත් කරන ලද කමිටුව විසින් තීරණය කර තිබුණ ද ඒ සඳහා HS Code වර්ගීකරණ කමිටුවක විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණු අතර මෙම මාළු තොගය නරක් වූ ස්වභාවයක් ගෙන ඇති බව වාර්තා කළ ද, HS Code 511.91.10 යටතේ Whole Round Tuna In Bulk ලෙස රේගු සටහන්කරයේ ඇතුළත් කර ඒ අනුව රේගුව විසින් රු. 6,288,357 බදු අයකරගෙන තිබුණි. | මෙම ද්‍රව්‍ය වර්ගීකරණ අංක **0511.91.10** යටතේ මත්ස්‍ය අපද්‍රව්‍ය (**Fish Waste**) ලෙස වර්ගීකරණය කොට ඇත. මෙම වර්ගීකරණය නිවැරදි බැවින් හා වර්ගීකරණය පිළිබඳ අපැහැදිලිතාවක් ඇතිවූ අවස්ථාවකදී පමණක් **"**වර්ගීකරණ කමිටුවක්**"** වෙත යොමු කිරීම සිදු කරන බැවින්**,** මෙහිදී වර්ගීකරණ තත්වයකට පත් කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී නොමැති බව සඳහන් කරමි. | මාළු තොගය නරක් වූ ස්වභාවයක් ගෙන ඇති අවස්ථාවක් බැවින් වර්ගීකරණය පිළිබඳ අපැහැදිලිතාවක් ඇති අතර එවිට **"**වර්ගීකරණ කමිටුවක්**"** වෙත යොමු කිරීම අවශ්‍ය බව. |
| **(ii)** | ආනයන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ආනයන අපනයන පාලක ජනරාල්වරියගෙන් අයදුම් කළ යුත්තේ මෙම මාළු තොගය මිලට ගත් සමාගම වුව ද, නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ, මධ්‍යම අපහරණ අංශය(Central Disposal Directorate) විසින් 2022 මැයි 22 දින ආනයන පාලන බලපත්‍රයක් අවශ්‍ය බවට ආනයන හා අපනයන පාලකවරියට දැනුම් දී තිබුණි. | මීට අදාල ආනයන බලපත්‍රය අංක **IM-5-550-2022-001380** යටතේ, **Eco N Rich Organic Fertilizer** වෙත නිකුත් කොට ඇත. | රේගු නිලධාරීන් විසින් ආනයන පාලන බලපත්‍ර අවශ්‍ය බවට ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට ඉල්ලීම් නොකළයුතු බව. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | පොහොර නිෂ්පාදකයාගේ ධාරිතාවය පිළිබඳව නොසලකා හැර විශාල මාළු තොගයක් පොහොර නිපදවීමට ලබාදීමෙන් ප්‍රමාණවත් ධාරිතාවයෙන් යුතුව කටයුතු සිදු නොවීම (ප්‍රමාණවත් ශ්‍රමය හා උපකරණ නොමැති නිසා) හා ඇතැම් බහාළුම්වල ශීතකරණ සඳහා විදුලිය සැපයීම ඇණ හිටීමෙන් එම මාළු ගබඩා ආශ්‍රිතව සෞඛ්‍යයට අහිතකර තත්ත්වයක් නිර්මාණය වී අධික දුගඳ හමන තත්ත්වයක් හා බහාලුම්වලින් ගලන අපවිත්‍ර ද්‍රාවණයන් හේතුවෙන් අවට පරිසරය අපවිත්‍ර වීමේ තත්ත්වයක් උද්ගත වී ඇති බවත් එම ගබඩා පරිශ්‍රයන්ට අදාළව 2022 අගෝස්තු 16 දින සිදු කළ ස්ථානීය පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ අතර මේ හේතුවෙන් ප්‍රදේශවාසීන්ගෙන් චෝදනා එල්ල වී තිබුණු අතර, 2022 ජූලි 07 දින මහබාගේ පොලිස් ස්ථානාධිපතිවරයා විසින් ගබඩා කර ඇති බහාළුම් 60 ක් ඉවත් කර ගන්නා ලෙස ද දැනුම් දී තිබුණු බව ද නිරීක්ෂණය විය. | පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය බලපත්‍රය පොහොර ලේකම් කාර්යාලය මඟින් **2021.10.28** දින මෙම සමාගම වෙත නිකුත් කර ඇත. | මහජන සෞඛ්‍යයට අහිතකර තත්ත්වයක් නිර්මාණය වේද යන්න පිළිබඳව ද සැලකිල්ලට ගතයුතු බව. |
| **(iv)** | හදිසි අවස්ථාවක දී නෞකාවට සිදුවන දෝෂයන්ට ආසන්නතම වරායේ යම් පහසුකම් සැපයීමක් ලබා දීම සිදු කළ ද, රේගු ආඥා පනතේ (අ) උපලේඛනයට අනුව රට තුළට ගෙන්වීම තහනම් සහ සීමා කරන ලද භාණ්ඩ අතරට එම උපලේඛනයේ (12) වගන්තිය අනුව පළුදු වූ දුගඳ හමන හෝ අප්‍රිය තත්වයේ හෝ ආහාරයට නුසුදුසු සහ නීත්‍යානුකූල පාවිච්චියට නුසුදුසු හෝ ස්පර්ශයට නුසුදුසු හෝ ලෙඩ රෝග සැදෙන සුළු මාළු වර්ග, ධාන්‍ය වර්ග හා වෙනත් දේ ආනයනය තහනම් කර තිබිය දී සහ රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව ප්‍රතිඅපනයනය කිරීමට මෙරට නැව් නියෝජිත ආයතනයට දැනුම් නොදී ඊට පටහැනි ලෙස රේගුව විසින් මෙම | මේ සම්බධයෙන් තව දුරටත් විමර්ශන කෙරෙමින් පවතින අතර එය අවසන් වීමෙන් පසු මේ පිළිබඳව පිළිතුරු ලබා දීමට හැකිය. | රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | නුසුදුසු මාළු තොගය ශ්‍රී ලංකාව තුළට නිදහස් කිරීමට තීරණය කර තිබුණි. | | |
| **(v)** | මාළු තොග නිදහස් කිරීමේ දී රේගු සටහන්කර 17 ක් පිළිගෙන ඉහත සඳහන් ආයතනය වෙත නිදහස් කිරීමට පියවර ගෙන තිබුණු අතර මෙම රේගු සටහන්කර සැකසීමට දේශීයව සැකසූ Way Bill, Invoice, Packing List උපයෝගී කර ගැනීම විගණනයේ දී ප්‍රශ්නගත විය. | අදාළ නැව් බඩු ලේඛනය රේගු දත්ත පද්ධතියට මූලික වශයෙන් **Transhipment** ලෙස ඇතුළත් කර ඇති අතර මධ්‍යම අපහරණ අංශය මඟින් කරන ලද ඉල්ලීමක් මත අදාළ නැව් බඩු ලේඛන වල **Nature** එක එනම්**,** තත්ත්වය **Transhipment** සිට **Local** දක්වා **Edit** කර ඇත. | රේගු සටහන්කර සැකසීමට දේශීයව සැකසූ Way Bill, Invoice, Packing List ආදිය උපයෝගී කර ගත නොහැකි බව. |
| **(vi)** | කාර්මික දෝෂයකට ලක් වූ බව පවසන CMA CGM KAILAS නෞකාව ලංකා වරායට ලඟා වූ දිනය 2022 ජනවාරි 13 ලෙස නැව් නියෝජිත ආයතනයේ ලිපිවල සඳහන්ව තිබිය දී රේගු සටහන්කරවල නැව වරායට ලඟා වූ දිනය 2022 පෙබරවාරි 08 ලෙස සටහන් කර තිබුණි. | අදාළ නෞකාව ලංකාවේ රේගුව වෙත ලඟා වූ දිනය **2022** පෙබරවාරි **09** ලෙස නැව් නියෝජිත ආයතනයේ ලිපියක සඳහන් වේ. | රේගු සටහන්කරවල නැව වරායට ලඟා වූ සත්‍ය දිනය සඳහන් විය යුතු බව. |
| **(vii)** | රේගු ආඥා පනතේ 162 වගන්තිය ප්‍රකාරව මාළු තොගය නීතිවිරෝධී බව ප්‍රකාශකිරීමක් සිදු නොකර රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට රේගු ආඥා පනතේ 12 සහ 43 වගන්ති ප්‍රකාරව අපහරණය කළ නොහැකි වුව ද එවැනි ප්‍රකාශ කිරීමකින් තොරව අපහරණය සිදු වී තිබුණි. | දෙපාර්තමේන්තු නියෝග **1450** අනුව රාජසන්තක කල **(Forfeited),** රඳවාගනු ලැබූ **(Seized)** හෝ අතහැර දමනුලැබූ **(Abandon)** භාණ්ඩ අපහරණය කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව එම භාණ්ඩ **"**අතහැර දමනුලැබූ භාණ්ඩ**"** බවට සලකන්නේද යන්න විමර්ශනය කෙරෙමින් පවතී. | රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| **(viii)** | රේගු ආඥා පනතේ 34(1) වගන්තිය අනුව ශ්‍රී ලංකා වරායට බඩු බෑම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවසරපත්‍රයක් දෙනු ලැබී නම් මිස යම් නැවකින් කිසිම භාණ්ඩයක් ගොඩ නොබෑ යුතු අතර ගොඩබානු ලබන සියළුම බහාළුම් සඳහා ශ්‍රී ලංකා රේගුවේ අවසරය හා අනුමැතිය අවශ්‍ය වුව ද අදාළ ගොනු පරීක්ෂා කිරීමේ දී එවැනි අවධානයක් රේගුව යොමු කළ බවට සාක්ෂි නොතිබුණි. | මේ පිළිබඳව පරීක්ෂා කර බලා වාර්තා කිරීමට සටහන් කර ගතිමි. | රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ඊ) | **ශ්‍රී ලංකා රේගුව විසින් බහාළුම් අංගනවල රඳවාගෙන ඇති අත්‍යවශ්‍ය භාණ්ඩ සම්බන්ධයෙන් සිදුකරන ලද විගණන පරීක්ෂාව**<br>රේගුව විසින් රඳවාගෙන ඇති අත්‍යවශ්‍ය භාණ්ඩ පිළිබඳව සිදුකළ විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| **(i)** | 2021 වර්ෂයේ ජනවාරි මාසයේ සිට 2022 අගෝස්තු 01 දින වන විට රේගු පරීක්ෂණ සිදු කරමින් පැවතුණු ආහාර ද්‍රව්‍ය ඇතුළත් බහාළුම් 27 ක් සම්බන්ධයෙන් ආනයනකරුවන් විසින් අදාල වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා එම බහාළුම් ඔවුන් වෙත නිදහස් කිරීම දින 95 සිට දින 563 ක් දක්වා ප්‍රමාද වූ අවස්ථා විය. ආනයනික ද්‍රව්‍ය සඳහා අනුමැතීන් (නිර්දේශ) ලබා දිය යුතු ආයතන වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ආදියෙන් එකී සහතික ලැබීමේ ප්‍රමාදය මෙයට බලපා තිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. | අවශ්‍ය අනුමැතීන් (නිර්දේශ) ලබා දෙන ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කඩිනම්ව සිදුකළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | රේගු විමර්ශන කටයුතු හේතුවෙන් ඒ යටතේ පවතින රැන්කින් කන්ටේනර් ටර්මිනල් (RCT)අංගනයේ 2022 අගෝස්තු 01 දිනට ආහාර ද්‍රව්‍ය ඇතුලත් බහාළුම් 88 ක් දින 60 සිට දින 778 දක්වා කාලයක් රඳවා තිබුණි. ඒවායේ වටිනාකම රු. 745,383,250 ක් විය. | අදාළ ප්‍රශ්ණගත බහාළුම් සම්බන්ධයෙන් වන රේගු පරීක්ෂණ පවත්වා කඩිනමින් අවසන් කරන ලෙසට උපදෙස් ලබා දී ඇත. | බහාළුම් සම්බන්ධයෙන් වන රේගු පරීක්ෂණ කඩිනමින් පවත්වා අවසන් කළ යුතු බව. |
| **(iii)** | ශ්‍රී ලංකාවට කහ ආනයනය කිරීමේ දී සංයෝජිත වර්ගීකරණ සංකේත 0910.30.10 ට අදාල කුඩු නොකළ හා නොඇඹරූ කහ සඳහා බලපත්‍රයක් ලබාගත යුතු බව 2019 දෙසැම්බර් 06 දින අංක 2152/63 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර තිබුණි. ඒ සමඟම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් "විරෝධතා නොමැත"(No objection letters) යනුවෙන් ලිපියක් ද ලබාගත යුතු විය. කෙසේවුවද, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආනයන අපනයන පාලක ජනරාල්වරයා වෙත 2020 මැයි 10 දිනෙන් පසුව කහ තොග නිදහස් කර ගැනීම සඳහා අදාල වන "විරෝධතා නොමැත"(No objection) ලිපි නිකුත් නොකිරීමට තීරණය කළ බව දැනුම් දී තිබුණි. ඉහත තීරණය ගැනීමෙන් පසුව 2020 මැයි 10 දින රු.151,979,588 ක් වටිනා කහ කිලෝග්‍රෑම් 624,877 ක් ලංකාවට ආනයනය කර තිබූ අතර 2022 අගෝස්තු 01 දින වන විට ද රේගුව විසින් වසර 02 කට අධික කාලයක සිට අවශ්‍ය නීතිමය කටයුතු සිදු නොකර රඳවාගෙන තිබුණි. | මධ්‍යම විමර්ශන අංශයට අදාලව **RCT** හි දැනට රාජසන්තක කරන ලද රු. **185,137,064**ක් වටිනා කහ කිලෝ ග්‍රෑම් **752,739**ක් අඩංගු බහාලුම් **42**ක් පවතින අතර එයින් බහාලුම් **15**ක් අපහරණය සඳහා මධ්‍යම අපහරණ අංශයට යොමු කර ඇත. | බහාළුම් නිදහස් කිරීමට අවශ්‍ය නීතිමය කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | Temporary Importation for Export Processing Scheme (TIEP) යෝජනා ක්‍රමය යටතේ පොල්තෙල් (Coconut oil) ආනයනය කර අගය එකතු කර ප්‍රතිඅපනයනය කිරීම සඳහා රේගුවේ ලියාපදිංචි වූ සමාගමක් විසින් එපරිදි පොල්තෙල් ප්‍රතිඅපනයනය නොකර වර්ෂ ගණනාවක සිට දේශීය වෙළඳපොලට අලෙවිකර රජයට බදු ආදායම් අහිමි කර තිබුණි. මේ සම්බන්ධයෙන් රේගුව සිදුකළ විමර්ශනයට අනුව 2014 සිට 2017 දක්වා කාලපරිච්චේදය තුළ දී ඉහත පෞද්ගලික සමාගම විසින් දේශීය සමාගමකට අලෙවි කළ පොල්තෙල් ප්‍රමාණය 463,065kg ක් වූ අතර රේගු විමර්ශණයෙන් නියම කළ දණ්ඩන වටිනාකම රු. 477,377,802 ක් විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| **(i)** | TIEP යෝජනා ක්‍රමය යටතේ පහසුකම් ලබන ආයතන පිළිබඳව රේගු නිලධාරීන් විසින් සෑම වර්ෂයකම විධිමත් අධීක්ෂණයක් සිදු කළ යුතු වුවද, එවැනි අධීක්ෂණයක් සිදු වී නොතිබීම නිසා මෙවැනි තවත් වංචා සමාගම් විසින් සිදුකළ හැකි බව විගණනයේදී බැහැර කළ නොහැකිය. | කාර්යමණ්ඩල සේවක සංඛ්‍යාවේ ප්‍රමාණය අනුව වසරකට වරක් ක්ෂේත්‍ර ගත නිරීක්ෂණ සිදු කිරීමට කටයුතු කරනු ලබයි. | (TIEP) යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සමාගම් පිළිබඳව ක්ෂේත්‍ර ගත පරීක්ෂණ සිදු කළ යුතු බව. |
| **(ii)** | පෞද්ගලික සමාගමට පැනවූ රු.477,377,802 ක දණ්ඩන වටිනාකම රේගු ආඥා පනතේ 163 වගන්තිය ප්‍රකාරව රු. 90,000,000 ක් දක්වා ලිහිල් කිරීමට (Mitigate) රේගුව කටයුතු කර තිබුණු අතර එහිදී රේගු ආඥා පනතේ 166 (ආ) ප්‍රකාරව දණ්ඩනයට හෝ රාජ සන්තක කිරීමට මුල් වූ කඩකිරීමේ බරපතලකම, අහිමි වූ ආදායම් ප්‍රමාණය ආදී කරුණු නොසලකා | එම පෞද්ගලික සමාගමට පැනවූ රු.**477,377,802**ක අහිමි කිරිම රේගු ආඥා පනතේ **163** වගන්තිය ප්‍රකාරව රු.**90,000,000**ක් දක්වා අඩු කිරීමට **(MITIGATE)** රේගු විමර්ශන නිලධාරියා කටයුතු කර ඇත. | රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | හැර තිබුණි. කෙසේවුවද, TIEP යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වීම හේතුවෙන් රජයට මෙම සමාගම විසින් අහිමි කළ මුළු අලාභය රු.63,567,715 ක් වූ අතර අහිමි කිරීම් වටිනාකම රු. 90,000,000 ක් දක්වා අඩු කිරීම හේතුවෙන් මහා භාණ්ඩාගාරයට සත්‍ය වශයෙන්ම ලද ආදායම රු. 27,000,000 ක් (Rs. 90,000,000 × 30%) දක්වා අඩු වී තිබුණි. | | |
| (ඌ) | නැගෙනහිර පළාත් ජල සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ජපන් රජය විසින් ලබාදී ඇති ආධාරයක් මත ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරය විසින් එම ව්‍යාපෘතියට අවශ්‍ය DI පයිප්ප හා උපාංග ගෙන්වීමේ කාර්යය සඳහා ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයට පවරා තිබුණු අතර ඒ සඳහා මණ්ඩලය පෞද්ගලික ආයතනයකට කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි. රේගු ආඥා පනතේ 72 වන වගන්තිය ප්‍රකාරව පළමු අවස්ථාවේදී බදු නොගෙවා භාණ්ඩ ගුදම් ගත කිරීම සඳහා රේගුව විසින් එම පෞද්ගලික ආයතනයට අවස්ථාව ලබාදී තිබූ අතර ඒ සඳහා රේගු සටහන්කර (Cusdec) 08 ක් නිකුත් කර ඇ.ඩො. 5,139,621 ක භාණ්ඩ ගුදම් කර (To Bond) තිබුණි. රේගු ආඥා පනතේ 86 වන වගන්තිය අනුව භාණ්ඩ ගුදමෙන් නිදහස් කර ගැනීමේදී කලින් ප්‍රකාශ කරන ලද භාණ්ඩ තොගයේ ඉන්වොයිස් අගයම ප්‍රකාශ විය යුතු වුවද, දේශීයව සැකසූ ඉන්වොයිස් භාවිතා කර අදාල වටිනාකම මගින් ඇ.ඩො. 6,350,364 ක් ලෙස ව්‍යාජ තොරතුරු සහිත ආනයන සටහන්කර ඉදිරිපත් කර එමඟින් ඇ.ඩො. 1,210,743 ක වටිනාකමක් අදාල ආයතනයට වැඩිපුර ලබා ගැනීමට අවස්ථාව සලසා තිබුණි. | මෙම විගණන විමසුම සිදුවන අවස්ථාව දක්වාම ගුදම්ගත කිරීමේ (TO-BOND) සටහන් කරයේ වටිනාකමට වඩා වැඩි අගයක් සහිත ගුදමෙන් ඉවත් කිරීමේ (EX-BOND) සටහන්කර බාර ගැනීම පරිචයක් ලෙස සිදු කර ඇත. ඉහළ අගයක් සහිත ඉන්වොයිසි නිර්මාණය කිරීම පිළිගත් සාමාන්‍ය වාණිජ ක්‍රමවේදයකි (TRADE NORM).<br>මේ වන විට නීතිපතිතුමාගේ තීරණය අනුව ගුදම්ගත කිරීමේදී (TO – BOND) වන වටිනාකම ගුදමෙන් ඉවත් කිරීමේදී ද (EX-BOND) භාවිතා කරනු ලබයි. | රේගු ආඥා පනතේ 86 වන වගන්තිය අනුව භාණ්ඩ ගුදමෙන් නිදහස් කර ගැනීමේදී කලින් ප්‍රකාශ කරන ලද භාණ්ඩ තොගයේ ඉන්වොයිස් අගයම ප්‍රකාශ විය යුතු බව. |

ව්‍යාජ ඉන්වොයිස් සැකසීම හා ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම ආදී වශයෙන් අදාල ආයතනය සිදු කරන ලද වැරදි සම්බන්ධව වැඩිපුර වැය වී ඇති මුදල නැවත අයකර ගැනීමේ හැකියාවන් පිළිබඳ අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස 2021 අප්‍රේල් 06 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දී නියෝග කර තිබුණ ද, විගණන දිනය වූ 2023 අප්‍රේල් 30 දින වන විටත් එපරිදි කටයුතු කර නොතිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනයේ ක්‍රියාකාරීත්වයට හා කාර්ය සාධනයට අවශ්‍යම වූ නීති නිලධාරියෙකු, තාක්ෂණික නිලධාරීන් 02 ක් හා සංඛ්‍යාන නිලධාරියෙකුගේ සේවය සමාලෝචිත වර්ෂය අවසාන දිනට ද පුරප්පාඩුව පැවතුණි | රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් නිති අංශයේ කටයුතු ඉටුකරන බැවින් නීති අධ්‍යක්ෂ තනතුරක් අවශ්‍ය නොවන බවත් සාමාන්‍ය රාජකාරි කටයුතු ඉටුකිරීමේදී අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට නීති නිලධාරීයෙක් බඳවා ගැනීමට අනුමැතිය ලබාදෙන ලෙසත් ඉල්ලා යැවීමට ලිපියක් කෙටුම්පත් කර ඇත. | ආයතනයේ ක්‍රියාකාරීත්වයට හා කාර්ය සාධනයට අවශ්‍ය මානව සම්පත් පිළිබඳව අවධානය යොමු කළ යුතු බව. |